Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2020), Vol. 05 (01)

# A Cultural Feminism Analysis of Modern Sinhala Poetry of Female Poets Revealed on the Female Cultural Oppression: Resourcing from Poetry of *Anuradha Nilmini, Suharshani Dharmarathna* and *Vipuli Hettiarachchi*

H. M. B. Herath

National Child Protection Authority, Sri Lanka

**Article Info**

Article History:
Received 01 December 2019
Accepted 25 May 2020
Issue Published Online 31 January 2020

**Key Words:**
Female cultural-oppression
Female ideology
Gender roles
Male core culture

*Corresponding author
E-mail address: hmbikherath@gmail.com

Journal homepage: http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v05i01.05

VJHSS (2020), Vol. 05 (01), pp. 47-56

ISSN 1391-1937
ISSN 2651-0367 (Online)

©Faculty of Humanities and Social Sciences 2020

## ABSTRACT

*Feminism is an expression of female agony and exhibiting their oppression. In modern poets too, female poets exhibit the expression of female agony through their creations. Those female poets try to express the oppression they experienced and all the females as whole through female ideologies. The main focus of this study is the modern female poets are being culturally oppressed. The difference of femininity is inherited from naturally and the gender has been created by the patriarchal culture. Religion, Customs, Marriage, Morals, the system of ownership, Industries are the incidental elements that subjected to suffer culturally according to the female poets represent through radical poetries. According to the modern female poets that are expressed through their creations, females are suffered physically and mentally than ideology suffering. This research studies how the females are suffered from culturally by selected poetries written on modern poets Anuradha Nilmini, Suharshani Dharmarathna and Vipuli Hettiarachchi. This study is qualitative and selected primary recourses as poets of Anuradha Nilmini, Suharshani Dharmarathna and Vipuli Hettiarachchi. And, as secondary resources this research uses literal articles and books that are written under the feminism, culture and female cultural oppression by modern female poets.*

**මාතෘකාව**
නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණවලින් හෙළිවන සංස්කෘතික ස්ත්‍රී පරිපීඩනය පිළිබඳව සංස්කෘතික ස්ත්‍රීවාදී විශ්ලේෂණයක්: *අනුරාධා නිල්මිණි, සුහර්ෂණි ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි* යන කිවිඳියන්ගේ තෝරාගත් පද්‍ය නිර්මාණ කිහිපයක් ඇසුරෙනි

## 1. හැඳින්වීම

නූතන සිංහල කවියෙහි හඳුනාගැනීමට හැකි කැපී පෙනෙන යුග ප්‍රවණතාවක් වන්නේ නව සිංහල කිවිඳියන් රාශියක් සිංහල කාව්‍ය ක්ෂේත්‍රය වෙත ආගමනය වී තිබීමයි. තවද යුග කාරක කිවිඳියක වීමට සමත්කම් දක්වන නව කිවිඳියන් රාශියක්ද ඒ අතර සිටියි. අනුරාධා නිල්මිණි, සුහර්ෂණි ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි, මාලතී කල්පනා ඇම්බ්‍රෝස් ආදී කිවිඳියෝ නූතන සිංහල කිවියෙහි සිටින යුගකාරක කිවිඳියක වීමට සමත්කම් පෙන්වන කිවිඳියෝ වෙති (අමරකීර්ති, 2017). 70 දශකයේ සිංහල කවිය වර්ණවත් කළ මොනිකා රුවන්පතිරණ සිංහල කාව්‍ය ක්ෂේත්‍රයෙහි අපට සිටින එකම යුගකාරක කිවිඳියයි. "කලාව ජනතාව උදෙසාය" යන ජනතාවාදී මතය වැළඳගනිමින්, ස්ත්‍රියක ලෙස තමන් විඳින ලද අත්දැකීම්ද උපයෝගි කරගෙන තමන්ද ඇතුළු දුක්විඳින පීඩිත පංතියේ ශ්‍රීලාංකේය ස්ත්‍රීය වෙනුවෙන් අඛණ්ඩව කවි ලියූ ආරම්භක කිවිඳිය මොනිකා රුවන්පතිරණයි. "අපි දෙන්නා සහ තවත් කිහිපදෙනෙක්", "තහනම් දේසයකින්", "අංගුලිමාලගේ සිහින", "ඔබ යෙහෙළිය ඇය ගැහැණිය", "විසිවසක ශේෂ පත්‍රය", "අසන් පත්තනි දේවතාවි", "සිරිපා කවි", "අලුත්ම සිහිනය", "හිපොක්‍රටීස් සහ රෝගිනිය" වශයෙන් කාව්‍ය ග්‍රන්ථ 08 ක් රචනා කළ රුවන්පතිරණ කිවිඳිය 1970 දශකයෙන් පසුව ශ්‍රී ලාංකේය සමාජයෙහි විෂම වූ සමාජ සාධක හේතුවෙන් පීඩනයට ලක්වන ස්ත්‍රීන්ගේ පීඩිත අත්දැකීම් ස්ත්‍රී දෘෂ්ටිකෝණයෙන් ඉදිරිපත් කරමින් සිංහල කවිය සුසාධිත සාහිත්‍ය ශානරයක් බවට පත්කිරීමට පුරෝගාමී වූ පළමු සිංහල කිවිඳියයි. රුවන්පතිරණ කිවිඳියගෙන් අනතුරුව කවි ලියූ බොහෝ කිවිඳියන් පිරිසක් සිංහල කාව්‍ය ක්ෂේත්‍රයේ සිටියද යුග කාරක කිවිඳියක වන්නට කාව්‍යමය බුහුටිකම් පෑ කිවිඳියක අසූව සහ අනූව දශකවලදී හමුනොවේ (අමරකීර්ති, 2017). එහෙත් නූතන සිංහල කිවිඳියෝ මොනිකා රුවන්පතිරණ කිවිඳියගේ ගමන් මාර්ගය අනුව ගමන් කරමින් නූතන සිංහල කවිය වස්තු විෂයයීක සහ අකෘතික විවිධත්වයෙන් සුසාධිත සාහිත්‍ය ශානරයක් බවට පත් කිරීමට උත්සාහ දරමින් සිටිති. ප්‍රේමය, විරහව, පරිසරය, මාතෘත්වය, සමකාලීන සමාජ ගැටලු ආදි විවිධත්වයෙන් යුතු කාව්‍යමය තේමාවන් කාව්‍යකරණයට යොදා ගන්නා නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණවල කැපීපෙනෙන ධාරණාව වන්නේ ස්ත්‍රී පරිපීඩනය පිළිබඳව ස්ත්‍රී දෘෂ්ටිකෝණයෙන් කාව්‍ය නිර්මාණය කිරීමයි. කවියන්ගේ කාව්‍ය නිර්මාණවලින් කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණ විශේෂිත වන්නේද කිවිඳියන් ස්ත්‍රී දෘෂ්ටි කෝණයෙන් ස්ත්‍රී පරිපීඩනය හෘද සංවේදීව ඉදිරිපත් කිරීම හේතුවෙනි. තවද ස්ත්‍රී පරිපීඩනය පිළිබඳව කවි ලියූ පළමු සිංහල කිවිඳියන් නූතන යුගයේ සිංහල කිවිඳියන් පමණක්ම නොවේ. මොනිකා රුවන් පතිරණ කිවිඳියගෙන් ආරම්භ වී අසූව සහ අනූව දශකයේ කවි ලියූ සීතා රංජනී, අයිරින් විජේවර්ධන, යමුනා මාලනී පෙරේරා ආදී කිවිඳියන්ද විවිධ වූ සමාජ සාධක හේතුවෙන් පරිපීඩනයට ලක්වන ස්ත්‍රීන්ගේ හෘද වේදනාව පිළිබඳව කවි ලියා තිබේ. එහෙත් නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණවල පවතින විශේෂත්වය වන්නේ මතු පිටට දර්ශනය නොවන, ඉසියුම් සමාජ, දේශපාලන, සංස්කෘතික, ආර්ථික සාධක හේතුවෙන් ආන්තීකරණයට ලක්වන ස්ත්‍රීන් පිළිබඳව ස්ත්‍රියක ලෙස තමන් ලද කම්පනයද උපයෝගී කරගෙන ස්ත්‍රී දෘෂ්ටියෙන් කාව්‍යකරණයෙහි නිරතවීමයි. අනුරාධා නිල්මිණි, සුහර්ෂණි ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි නූතන සිංහල කවිය නියෝජනය කරන කිවිඳියන් තිදෙනෙකි. මතුපිටට නොපෙනෙන සංස්කෘතික සාධකවලින් ස්ත්‍රිය පරිපීඩනයට ලක්වන ආකාරය පිළිබඳව සවිඤ්ඤාණිකව ඒ පිළිබඳව ස්ත්‍රීවාදි දෘෂ්ටිකෝණයෙන් කවි ලිවීම මෙම කිවිඳියන් තිදෙනාගේ විශේෂත්වයයි. මෙම පර්යේෂණයේදී නූතන සිංහල කිවිඳියන් වන අනුරාධා නිල්මිණි, සුහර්ෂණි ධර්මරත්න සහ විපුලි හෙට්ටිආරච්චි තම කාව්‍ය නිර්මාණවලින් ඉදිරිපත් කරන සංස්කෘතිකමය ස්ත්‍රී පරිපීඩනය පිළිබඳව සංස්කෘතිකමය ස්ත්‍රී දෘෂ්ටිකෝණයෙන් අධ්‍යයනය කෙරෙයි.

මෙම පර්යේෂණයේ ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් නූතන සිංහල කිවිඳියන් විසින් රචනා කරන ලද කාව්‍ය නිර්මාණ භාවිත කෙරිණි. එහිදී විශේෂයෙන්ම අනුරාධා නිල්මිණිගේ " වත්සියපත්" (2014), සුහර්ෂණි ධර්මරත්නගේ " සුදුවත ඇඳි කෙකනිය" (2015), විපුලි හෙට්ටිආරච්චිගේ "රූ" (2015) යන කාව්‍ය කෘතිවල තෝරාගත් කාව්‍ය නිර්මාණ ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය ලෙස භාවිත කරනු ලැබිණි. මෙම කාව්‍ය ග්‍රන්ථ ත්‍රිත්වය පමණක් ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිත වන්නේ ස්ත්‍රිය සංස්කෘතිකමය පරිපීඩනයට ලක්වන ආකාරය ගැඹුරින් නිරූපණය වන කාව්‍ය නිර්මාණ මෙම කාව්‍ය ග්‍රන්ථ ත්‍රිත්වයෙහි අන්තර්ගත වීම

හේතුවෙනි. තවද, ද්විතීය සාහිත්‍ය මූලාශ්‍රය ලෙස ස්ත්‍රීවාදය, සංස්කෘතික සහ සංස්කෘතික ස්ත්‍රී පරිපීඩනය, නූතන සිංහල කවිය පිළිබඳ රචනා වී තිබෙන ග්‍රන්ථ, ලිපිලේඛන, භාවිතයට ගැනිණි.

මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලු ලෙස නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණවලින් හෙළිවන පරිදි සංස්කෘතිය නැමැති සාධකය ශ්‍රී ලාංකේය ස්ත්‍රිය විෂයෙහි සිදුකරනු ලබන පරිපීඩනයෙහි බලපෑම කෙබඳුද ? සහ සංස්කෘතිය විසින් නූතන ශ්‍රී ලාංකේය ස්ත්‍රියට ලබාදී ඇති සමාජ කාරකත්වයෙහි ස්වභාවය කෙබඳුවීද ? යන්න විමසා බැලෙන අතර පර්යේෂණයේ අරමුණ ලෙස දියුණු යැයි සම්මත නූතන තාක්ෂණ යුගයේදීද සංස්කෘතිය නැමැති සාධකය ස්ත්‍රිය විෂයෙහි බලපැවැත්වෙන ආකාරය පිළිබඳව නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණ ඇසුරෙන් විමර්ශනය කිරීම දැක්විය හැකිය.

ස්ත්‍රීවාදය සාහිත්‍ය න්‍යායක් ලෙස සිංහල විචාර ක්ෂේත්‍රයෙහි දීර්ඝ කාලයක් පවතින නමුත්, සාහිත්‍ය නිර්මාණ සමඟ ස්ත්‍රීවාදය බද්ධකළ ස්ත්‍රීවාදී කියවීම් නූතන සිංහල විචාර ක්ෂේත්‍රයේදී හමුවන්නේ අල්ප වශයෙනි. තවද නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍යමය භාවිතය පිළිබඳවද විධිමත් පර්යේෂණයක් මෙතෙක් සිදුවී නොමැත. සිංහල සාහිත්‍ය විචාර ක්ෂේත්‍රයේ පවතින මෙම පර්යේෂණ රික්තය පූරණය කිරීමට මෙම පර්යේෂණය වැදගත්වනු ඇත.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණයක් වූ මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස අනුරාධා නිල්මිණිගේ "වත්සියපත්" (2014), සුහර්ෂණි ධර්මරත්නගේ "සුදුවත ඇඳි කෙකතිය" (2015), විපුලි හෙට්ටිආරච්චිගේ " රූ" (2015) යන කාව්‍ය කෘතිවල තෝරාගත් කාව්‍ය නිර්මාණ ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය ලෙස භාවිත කරනු ලැබීය. තවද, ද්විතීය සාහිත්‍ය මූලාශ්‍රය ලෙස ස්ත්‍රීවාදය, සංස්කෘතිකය සහ සංස්කෘතික ස්ත්‍රී පරිපීඩනය, නූතන සිංහල කවිය පිළිබඳව රචනා වී තිබෙන ග්‍රන්ථ, සාහිත්‍ය ලිපිලේඛන (ප්‍රකාශිත) භාවිත කෙරිණි.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

ස්ත්‍රීවාදය (Feminism) යනු සමාජයේ සෑම ක්ෂේත්‍රයකදීම ස්ත්‍රිය වෙත හිමිකොට ඇති අප්‍රධාන බව, සාපේක්ෂ අසමානත්වය හෙවත් වෙනස් කොට සැලකීම හා ඇය පරිපීඩනයට හා සූරාකෑමට ලක්කිරීම පිළිබඳව සංවේදී හා සවිඥ්ඥණික වන සහ එම අසමානත්වයන් අප්‍රධාන බව, පීඩනය හා සූරාකෑම දුරුකොට සමාජයේ සෑම අංශයකදීම පුරුෂයන්ට සමාන සම සාධාරණත්වයක් නිර්මාණය කිරීමේ මූලික අරමුණු සහිත දෘෂ්ටිවාදයකි (ලියනගේ සහ වලාකුළගේ, 2006: 39). එහිදී විශේෂයෙන්ම ලිබරල් ස්ත්‍රීවාදය, සමාජවාදී ස්ත්‍රීවාදය, රැඩිකල් ස්ත්‍රීවාදය, මනෝවිශ්ලේෂණ ස්ත්‍රීවාදය, සාන්දෘෂ්ටිකවාදී ස්ත්‍රීවාදය, පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදය, කළුජාතික ස්ත්‍රීවාදය ආදී වශයෙන් ස්ත්‍රීවාදය උපන්‍යායන්වලට බෙදී පවතියි. සංස්කෘතිකමය ස්ත්‍රීවාදයද ස්ත්‍රීවාදයේ තවත් එක් උපන්‍යායකි. සංස්කෘතික ස්ත්‍රීවාදීන්ගේ තර්කය වන්නේ සංස්කෘතිය විසින් කාන්තාව පරිපීඩනයට ලක්කරන බවයි. සංස්කෘතිය වනාහී දැනුම, ඇදහිලි, කලා, නීති, සදචාර, සිරිත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත්වන පුද්ගලයෙකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු පුහුණු හා හැකියාවන් අඩංගු වන මිනිසාගේ සමස්ත ජීවන මාර්ගයයි (Tylor, 1920) දැනුම, ඇදහිලි, කලා, නීති, සදචාර, සිරිත් විරිත්, භාෂාව, විවාහය, අයිතිය පිළිබඳව ක්‍රමය, ආචාර සමාචාර, කර්මාන්ත, ඇතුළු සමස්ත භෞතික හා අභෞතික සාධක සියල්ලම සංස්කෘතියෙහි උපසාධක වේ. සංස්කෘතික ස්ත්‍රීවාදින්ගේ තර්කය වන්නේ සංස්කෘතියෙහි අන්තර්ගත ඉහත සඳහන් කළ සාධක විසින් ස්ත්‍රිය පරිපීඩනයට ලක්කරන බවයි. එහිදී ස්ත්‍රිය හා පුරුෂයා අතර ඇති ජීව විද්‍යාත්මක වෙනස ඉවත දමා සංස්කෘතික සාධක කේන්ද්‍ර කරගෙන නිර්මාණය කර තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කේන්ද්‍රකරගෙන නිර්මාණය කර තිබෙන පුරුෂ මූලික සංස්කෘතිය ස්ත්‍රිය සංස්කෘතිකමය වශයෙන් පරිපීඩනයට ලක්කිරීමට හේතුවන බව සංස්කෘතිකමය ස්ත්‍රීන්වාදීන්ගේ ප්‍රධානතම තර්කයයි.

නූතන සිංහල කිවිඳියන් වන අනුරාධා නිල්මිණි, සුහර්ෂණි ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි යන කිවිඳියෝ සංස්කෘතිය මූලික කරගෙන නිර්මාණය වී පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කේන්ද්‍රකරගෙන

නිර්මාණය වී තිබෙන්නාවූ පුරුෂ මූලික සමාජය විසින් නූතන ශ්‍රී ලාංකේය ස්ත්‍රිය සංස්කෘතිකමය පරිපීඩනයට ලක්වන ආකාරය කාව්‍යමය බුහුටිතාවයෙන් සහ රැඩිකල්වාදීව නිරූපණය කරති. සුහර්ෂණී ධර්මරත්න කිවිඳියගේ " වැලන්ටයින් දවසෙත් අපි රණ්ඩු වුණා" පද්‍ය නිර්මාණය සංස්කෘතිය විසින් නිර්මාණය කර තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතුවෙන් ගෘහස්ථ පරිපීඩනයට ලක්වන ස්ත්‍රියකගේ හෘද විලාපය ඉදිරිපත් කරයි.

*වැලන්ටයින් දවසෙත් අපි රණ්ඩු වුණා*
*පොඩි චූටිට වෛරස් උණ*
*රෑ තිස්සෙම ඇඟ තෙමතෙම*
*හිටියේ ෆිට්එකට බයෙන්*
*ලොකු චූටිට විභාගේ අද*
*මං හිටියේ බත් බැඳ බැඳ*
*ඒ වෙලාවේ චූටි ඇඬුවේ ඇඳුම තෙමන්*

*චූටිගේ තෙත මාරු කරලා*
*ලොකූගේ සුදු ගවුම මැදලා*
*ඉවර කරලා උණ බැලුවම*
*දන්නෙම නෑ එකසිය ගාණකට නැගලා*
*චූටි ඇඬුවේ වෙවුල වෙවුලා*

*එයා හිටියේ රැවුල බබා*
*උරුවම් බානවත් ඇහුණා*
*බබා බලන්නට කීවම*
*එයාට අද යකා වැහුණා*
*ඒත් අම්මේ මං ඉවසුවා*

*එයාගේ අම්මා හිටියේ බණ අහ අහා*
*ටීවී එකටත් වැඳගෙන*
*"ළමයි බමයි නිදිකරලා*
*අපි නම් කුඹුරටත් ගියා"*
*එයා කිව්වේ මට ඇදේට*
*ඒත් අම්මේ මං ඉවසුවා*

*මේ සේරම කරන්න මට*
*තියෙන්නේ අත් දෙකයි කියලා*
*කිව්වෙත් මං බොහොම හෙමින්*
*මගේ කරුමෙට ඒක ඇහිලා*
*"ගෑණු දෙතුන් දෙනෙක් ගන්න*
*කියලද දූන් මට කියන්නේ"*
*එයා ඇහුවේ සද්දේ දමලා*
*"මගේ මොකද"*
*මාත් කිව්වා*
*"තමුසේ කියනකම් හිටියේ*
*මටත් ඕක හිතුනා"*
*එයා කිව්වේ ඔළුවේ ජෙල් ගාන ගමන්*
*ඒ වෙලාවේ මතක් වුණෙම*
*කොටට කොටේ ගවුම ඇඳන්*
*අවුරුදු පාටියට ඇවිත්*
*එයා  එක්ක මුකුළු කරපු*
*ජැකී ෂෙරන්*

*අම්මේ මට යකා වැහුණා*
*වතුර ජොග්ගුවත් පෙරළුණා*
*එයා ගියේ කේන්තියෙන්*
*ලොකු ගියේ බඩගින්නේ*
*නැන්දම්මත් බුම්මාගෙන*
*කෑවෙත් අද එහා ගෙයින්*

*ඔෆිස් එකට කෝල් කරලා*
*බබාට උණ බව කීවම*
*වැලන්ටයින් සමරනවද*
*සර්රුත් ඔච්චමට ඇහුවා*

*ඊයේ ෂෝට් ලීව් දමලා*
*ගත්ත කමිසේ බෑග් එකේ*
*දෙන්න හිතෙන්නෙත් නෑ දූන්*
*අම්මේ මට බනින්නෙපා*
*වැලන්ටයින් දවසෙත් අපි රණ්ඩු වුණා*

(ධර්මරත්න, 2015).

ධර්මරත්න කිවිඳිය කවිය වෙත එළඹෙන්නේ ස්ත්‍රීන් විසින් දෛනිකව සිදුකළ යුතු යැයි සම්මත වී තිබෙන "ස්ත්‍රී ක්‍රියාකාරකම්" යැයි සංස්කෘතිය විසින් නම් කරන ලද වැඩ රාශියක්ද සමගිනි. දරුවන් රැකබලා ගැනීම, දරුවන් පෝෂණය කිරීම, ගෙදර දොර කටයුතු කිරීම, ආගමික කටයුතු නෑදෑ හිතවත්කම් පැවැත්වීම ආදී ගෘහාශ්‍රිත කටයුතු කාන්තාවන්ට අයත් වූ ස්ත්‍රී ක්‍රියාකාරකම් වශයෙන් සංස්කෘතිය විසින්ම ස්ත්‍රීයට ස්වාභාවිකවම භාරකර තිබේ. තවද නිවසන් පිටත රැකියා සහ ආදායම් මාර්ගවල නිරතවීම, බාහිර සමාජ සම්බන්ධතා පැවැත්වීම සහ බිරිඳට සහ දරුවන්ට ආරක්ෂාව සැපයීම සංස්කෘතිය විසින් පුරුෂ ක්‍රියාකාරකම් වශයෙන් නම් කරනු ලැබ තිබේ (CIDA, 1993). මෙලෙස ස්ත්‍රී ක්‍රියාකාරකම් සහ පුරුෂ ක්‍රියාකාරකම් ලෙස සංස්කෘතිය විසින් වැඩ (ගෘහාශ්‍රිත කාර්යයන් සහ සමාජ කාර්යයන්) - වර්ග කිරීමට හේතු වී තිබෙන්නේ සංස්කෘතිය විසින්ම නිර්මාණය කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවයයි.

ජීව විද්‍යාත්මකව ස්ත්‍රීයට හා පුරුෂයාට ලැබී ඇති ලිංගික වෙනස මත සමාජය විසින් දීර්ඝ කාලයක් තිස්සේ වෙනස් වූ සමාජ තත්ත්වයන් මෙම දෙපක්ෂය සඳහා නිර්මාණය කර දෙනු ලැබ තිබේ.

> සමාජය හා සංස්කෘතිය විසින් ස්ත්‍රිය හා පුරුෂ වශයෙන් කරනු ලැබ ඇති මෙම බෙදීම සමාජයේ සෑම ස්ථානයකදීම දක්නට ලැබේ. ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට එකිනෙකට වෙනස්වූ ගති ලක්ෂණ, අනන්‍යතා, හැසිරීම් රටා, භූමිකා සහ වෘත්තීන් පවා සමාජය විසින් නිර්මාණය කරනු ලැබ ඇත. ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට පවරා ඇති එම සමාජ, සංස්කෘතික තත්ත්වය ස්ත්‍රී පුරුෂ සමාජභාවය ලෙස සරලව හැඳින්විය හැකිය (ලියනගේ සහ වලාකුළගේ, 2006).

ස්ත්‍රී පුරුෂ ලිංගික භේදය ඉවත දමා සංස්කෘතිය විසින් නිර්මාණය කරන ලද සමාජ සබඳතාව ස්ත්‍රී පුරුෂ සමාජභාවයයි. ඒ අනුව "ස්ත්‍රී ක්‍රියාකාරකම්" යැයි හඳුන්වන දරුවන් බලා ගැනීම, ගෙදර දොර වැඩ කටයුතු කිරීම, නෑදෑ හිතවත්කම් පැවැත්වීම, ආගමික කටයුතු සිදුකිරීම ආදී ගෘහාශ්‍රිත කටයුතු කාන්තාවට පවරමින් කාන්තාව පවුල් සත්ත්වයකු (Family Animal) ලෙස ස්ථාන ගත කර තිබෙන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයයි. සංස්කෘතියෙහි අන්තර්ගත ආගම, විශ්වාස, ඇදහිලි හා සිරිත් විරිත් උපයෝගී කරගෙන දෘෂ්ටිවාද මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රිය පවුල් සත්ත්වයෙක්ය බවට වන ප්‍රවාදය සමාජයට කාවද්දා තිබේ. ධර්මරත්නගේ " වැලන්ටයින් දවසෙත් අපි රණ්ඩු වුණා" යන පද්‍ය නිර්මාණයේ අභ්‍යන්තර කණිකා මගින් මතුවන්නේ ගෘහාශ්‍රිත කටයුතු හේතුවෙන් හෙම්බත් වී පරිපීඩනයට ලක්වූ ස්ත්‍රියකගේ හෘද විලාපයයි. තවද මෙම පද්‍ය නිර්මාණය අභ්‍යන්තරයෙන් මතුකරන ආකාරයට ගෘහාශ්‍රිත කටයුතු සිදුකිරීමෙන් ඇතිවන කායික, මානසික ආතතිය ස්ත්‍රිය තනිවම විඳ දරාගත යුතුය. ස්ත්‍රිය හා පුරුෂයා අතර පවත්නා වූ ජීව විද්‍යාත්මක වෙනස සංස්කෘතිය විසින් විශාල කොට විශ්වමය පුරුෂාධිපත්‍යයක් නිර්මාණය කරනු ලැබ තිබෙන බව එඩ්වඩ් විල්සන්ගේ තර්කයයි (කුමාර, 2009: 104). මෙහිදී විශ්වමය පුරුෂාධිපත්‍යය නිර්මාණයවීමට හේතුවී තිබෙන්නේ සංස්කෘතිකමය වශයෙන් ස්ත්‍රිය හා පුරුෂයා අර්ථ දක්වා ඇති ආකාරයයි. සංස්කෘතිය, ස්ත්‍රිය හා පුරුෂයා අර්ථ දක්වා ඇති ආකාරය පහත පරිදි වේ.

**වගු අංක 1.** පුරුෂයා සහ ස්ත්‍රිය අතර විෂමතා

| | පුරුෂයා | ස්ත්‍රිය |
|---|---|---|
| i. | ශරීර ශක්තිය හැඩි දැඩි ශක්තිමත් | මුදු මොළොක්, කෝමළ, ළාමක |
| ii. | ලිංගික ප්‍රහාරකයා | ලිංගික පීඩිතයා |
| iii. | තාර්කික (Rational) ලෙස සිතන | හැඟීම්බර (Emotional) ලෙස කටයුතු කරන |
| iv. | විශ්ලේෂණකාරි | සංස්ලේශිත |
| v. | උන්නතවාදී ඒකියවාදී | සමස්තය ගැන සිතන, බහුවිධ |
| vi. | පරිසර ආක්‍රමණකාරි | ගහකොළ, සතා සිව්පාවාට කැමති |
| vii. | ද්විකෝටික තාර්කික | ද්විකෝටිකයට අකමැති |
| viii. | අධික කෝපය | ඉවසිලිවන්ත භාවය |
| ix. | පහසුවෙන් සසල නොවන | පහසුවෙන් සසල වන |
| x. | නායක, ප්‍රධානියා | කීකරු යටත් වැසියා (කුමාර, 2009: 6-7). |

ඉහත දළ සටහන නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි වන්නේ පුරුෂයා හැඩිදැඩි, ශක්තිමත්, ඉක්මන් තීරණ ගතහැකි, තාර්කික සහ බුද්ධිමත් පුද්ගලයෙකු ලෙසත්, ස්ත්‍රිය මෘදු මොළොක්, ඉක්මන් තීරණ ගත නොහැකි, ඉක්මනින් සසලවන තැනැත්තියක් ලෙසත් නිරූපණය කර තිබෙන ආකාරයයි. තවද පුරුෂයා සමාජ ප්‍රගමනයට දායක වන නායකයෙකු ලෙසත්, ස්ත්‍රිය පුරුෂයා මත යැපෙන පුරුෂයාට පිටුපසින් ගමන් කරන පුරුෂයාගේ උපභටයෙකු ලෙසත් සංස්කෘතිය විසින් අර්ථකථනය කර තිබේ. පුරුෂයා සමාජයෙහි "නායකයා" ලෙසට නිර්මාණය කර තිබෙන සංස්කෘතික දෘෂ්ටිවාදය හේතුවෙන් පුරුෂයා වටා අසීමාන්තික බලයක් ගොඩනැගී තිබේ. පුරුෂයා වටා ගොඩනැගී තිබෙන මෙම අසීමාන්තික බලය මූලික කරගෙන ස්ත්‍රිය පුරුෂයාට වඩා බලයෙන් අඩු සහ අප්‍රධාන තැනැත්තියක් බවට සංස්කෘතිය

විසින් ස්වාභාවීකරණය කර තිබේ. සංස්කෘතිය විසින් ස්වාභාවීකරණය කර තිබෙන ස්ත්‍රීය අප්‍රධාන සහ ද්විතීය තැනැත්තියක් බවට වන ප්‍රවාදය ස්ත්‍රීකාරකත්වය ක්ෂය කරමින් ස්ත්‍රී පරිපීඩනයට සෘජුව හේතුවී තිබේ. අනුරාධා නිල්මිණිගේ "සුමනසමන්ගෙන් කොටකෙතන බවලතුන්ට" යන පද්‍ය නිර්මාණය පුරුෂ මූලික සංස්කෘතිය විසින් කාන්තාව පරිපීඩනයට ලක්වන ආකාරය රැඩිකල්වාදීව නිරූපණය කිරීමට සමත්වෙයි.

*සුමන සමන්ගෙන්,*
*කොටකෙතන බවලතුන්ට..*

*තව එකුන් හද්‍ර කල්පයක්*
*දෙව්ලොව සරා*
*මයිත්‍රී නාමයෙන්*
*තුන් ලොවම එකලු'කර*
*නිවාලන්නෙමි*
*සර්වදාරයේ නැගෙන ගිනි*
*එතෙක් ඉවසනු මැනේ..*
*කොටකෙතන නැගණියේ..*

*සමන් මම,ගම ළගම*
*අතමානයේ වෙසෙමි*
*ගමන් යන,එන ගමන්*
*මෙහි පැමිණි බව දනිමි*

*බමන්නන් වෙසෙන බිම*
*ධවල සලුවෙන් වසමි*
*රවන්නට කාරි නැත*
*උන් කෝටු මස් කරමි*

*මුළු දේව සභාවම*
*ගැස්සිලා මේ ටිකට*
*කළුතාර දමන්නට*
*සැරසුණා,මගෙ ඉහළ*
*දලුදාපු හිනෑවහකදුරු*
*දැන් පත්තිනිට*
*බලු පුරුස ලිගු කපා*
*ගෙනෙමි,,මම ඒක මිටට*
*අහලගං හත අයිති*
*සමන්ටයි කිය,කියා*
*ගහලයින් වැල නොකැඩී*
*මෙහෙත් ඇවිදින් ගියා*
*පහළ බැවුම ළගදී*
*වැදෑමහ මග තියා*
*වහල පිපිරෙන තුරුම*
*ගින්න අවුළා ගියා*

*උස-මහත දිග පළල*
*දුටිමි,දැන සිටින්නෙමි*
*වස කවන,විස පොවන*
*තැන් දකිමි,හැඳිනෙමි*

*අසරණව නගන දුක්*
*අඳෝනා අසන්නෙමි*
*ඇස අරිනු කෙළෙස මතු*
*බුදු බවම පතන්නෙමි*

*අතේ සුදු නෙළුම මත*
*යෝනි මස් විසිරිලා*
*නැතේ එකලාසයක්*
*යන්ට උඩුගං බලා*
*හිතේ සංතාපයන්*
*පිහි තුඩක අමුණලා*
*කෙතේ වළලමි,මුලින්*
*මගෙ ලිගුව ගලවලා* (නිල්මිණි, 2014).

ශ්‍රී ලංකාවේ රත්නපුර දිස්ත්‍රික්කයට අයත් කොටකෙතන ප්‍රදේශය සුමනසමන් දෙවියන්ගේ අඩවියට අයත්වන්නා වූ කොටසකි. ශ්‍රී ලාංකේය ජනයා විශ්වාස කරන පරිදි සබරගමු පළාත සුමන සමන් දෙවියන්ගේ අඩවියයි. ජනසම්මත විශ්වාසය අනුව, සබරගමුව පළාතේ ගහකොළ, සතා සිව්පාවුන් ඇතුළු සමස්ත සබරගමු මිනිසුන්ගේ ආරක්ෂකයා වශයෙන් පෙනී සිටින්නේ සුමන සමන් දෙවියන්ය.

*සුද්ද ලෙසින් නිති ගත      බබලන්නේ*
*සුද්ද ඇතා පිටවද වැඩ      ඉන්නේ*
*බුද්ධ මේ ශාසන දියුණු      කරන්නේ*
*සුද්ද සමන් දෙවියෝය  වඩින්නේ*
(පඤ්ඤාලෝක, 1952: 191)

*ගොසින් වඳිමු සිරිපා      මුනිඳුන්නේ*
*සමන් දෙවිඳුවද භාරව      ඉන්නේ*
*සමන් දෙවිඳු මත්තට      බුදුවන්නෙ*
*පද්මේ වඳින්නට පිහිට    ලැබෙන්නේ*

ශ්වේත වර්ණයෙන් බබළමින්, ශ්වේත වර්ණයෙන්ම බබළන ඇත්රාජයෙකු පිට වැඩ සිටිමින් ශ්‍රීපාදස්ථානය ඇතුළු සමස්ත සබරගමුවේම ප්‍රාණීන් ආරක්ෂා කරන මහා බලවේගය සමන් දෙවියන් බව සබරගමු ජන විශ්වාසයයි. එහෙත් සුමන සමන් දෙවියන් ආරක්ෂකයා වන සබරගමුවේ කොටකෙතනෙහි කාන්තා මිනීමැරුම් ගණනාවක් සිදුවීම ලාංකේය සමාජ මනස්වල තවමත් අමතක නොවන මතකයක්ව තැන්පත්ව පවතියි. කොටකෙතන ප්‍රදේශයේ අඛණ්ඩවම කාන්තාවන් මරුමුවට පත්කළද එකදු

පුරුෂයෙක් හෝ මරණයට පත්කළේ නැත. කොටකෙතන ස්ත්‍රීන් මරණයට පත්කිරීමට මූලික වූයේ පුරුෂයන් මිස ස්ත්‍රීන් නොවේ. සබරගමුව රකිනා සුමනසමන් දෙවියන්ද පුරුෂයෙකි. හෙතෙම කොටකෙතන ස්ත්‍රීන්ගේ මරණයන්ගෙන් කම්පාවට පත්වෙයි. එහෙත් සුමන සමන් දෙවි පුරුෂයාගේ කම්පාව ව්‍යාජ කම්පාවක් බව හැඟෙන්නේ, මතු බුදුබව පතනා සුමන සමන් දේව පුරුෂයාටත් කොටකෙතන ස්ත්‍රීන් පිළිබඳව කම්පා වනවා හැර කරන්නට අන් යමක් නොවන බැවිනි.

*තව එකුන් හද්‍ර කල්පයක්*
*දෙව්ලොව සරා*
*මයිත්‍රී නාමයෙන්*
*තුන් ලොවම එකලු ’කර*
*නිවාලන්නෙමි*
*සර්වදාරයේ නැගෙන ගිනි*
*එතෙක් ඉවසනු මැනේ..*
*කොටකෙතන නැගණියේ..*

සුමන සමන් දේව පුරුෂයා කොටකෙතන ස්ත්‍රීන්ගෙන් ඉල්ලීමක් සිදුකරයි. ඒ තමන් බුදුබව ලබා ගන්නා තුරු තවත් එක් හද්‍රකල්පයක් පුරුෂයන් වෙතින් එල්ලවන පීඩනය ඉවසා සිටින ලෙසටයි. සුමන සමන් දේව පුරුෂයාගේ කල්පයක් ඉවසා සිටින්න යැයි කරන ප්‍රකාශයම පුරුෂ මූලික වෙයි. සුමන සමන් පුරුෂයා කියන්නේ තවත් හද්‍රකල්පයක් යනතුරු පුරුෂ මූලික සංස්කෘතිය විසින් ස්ත්‍රිය මත එල්ලකරනු ලබන පරිපීඩනය අඛණ්ඩව පවතිනු ඇති බවටයි. අනුරාධා නිල්මිණි සුමන සමන්ගෙන්, කොටකෙතන බවලතුන්ට පද්‍ය නිර්මාණයෙන් රැඩිකල්වාදීව ඉදිරිපත් කරනු ලබන්නේ පුරුෂ මූලික සංස්කෘතිය ස්ත්‍රීන් මරා දැමීමට තරම් ප්‍රබල වී ඇති බවටයි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලික කරගත් පුරුෂ කේන්ද්‍රීය වූ සංස්කෘතිය මඟින් පමණක් නොව සංස්කෘතියෙහි ආනුශාංගික අංග වන ආගම, සිරිත් විරිත්, ඇදහිලි විශ්වාස හේතුවෙන්ද ස්ත්‍රීය සංස්කෘතික පරිපීඩනයට ලක්වෙයි. විපුලි හෙට්ටිආරච්චිගේ ‘උ’-වැසියෝ නමින් වන පද්‍ය නිර්මාණය ආගම විසින් ස්ත්‍රිය සංස්කෘතිකමය පරිපීඩනයට ලක්කර ඇති ආකාරය කාව්‍යමය බුහුටි බවින් යුක්තව, සියුම්ව ඉදිරිපත් කරයි.

*‘උ’-වැසියකගෙන් .....*
*සිව්වණක් පිරිස මැද අපිත් හිටියා පෙරට*
*පන්සලේ ගම්දෙරේ දනුත් පිදුවා යසට*
*ආරාම උයන්වතු සොය සොයා ගොස් නිබඳ*
*පුරවරේ රෑ තිරේ බණත් ඇහුවා අපිම*

*සංසාරේ හැටි අනේ හැඳින අටලෝ දහම*
*කැටේ කැඩුවා කඩෙන් ගත්ත අට පිරිකරට*
*සතර පේරුවේ නැයෝ නිවන් යන පින්කමට*
*පිනේ පිං බර කොලුත් ඇරලුවා පන්සලට*

*පස්පවින් පස්මරුන් මද සිතින් සුදු වතට*
*මුනිඳු දළඳ පුදති අත්ගසා කරඬුවට*
*හේමමාලා බැන්ද මුහුලසින් වැඩියාට*
*කරඬුවට කිලි ගෑණු අපේ පව් වැදුණාම*

*රහත් සඟමිත් තෙරණි අතින් ගෙන වැඩියාට*
*මහබෝධි සාමිනේ කැපත් නැතුවා අපට*
*වැලි ගසා බෝපතක් තබා ලය මත බැතින*
*දෑත නළලේ තබා ඇත උන්නා පවට*

*යාර ගණනින් සුදුම සුදු පිළි ඔතාගෙන*
*පේවිලා ආවේ අපි අපේ බුදුන් දකින්නට*
*අපේ පොඩි කෙලි පොඩ්ඩි පවා දිග කලිසමට*
*උඩින් ඇන්ද ඔය පිරුවටේ  සුදු රෙද්ද*

*අපි අපේ පාඩුවේ අපේ පින් පිරුවාට*
*අපේ හාමුදුරුවෝවත් කියාදුන්නෑ අපට*
*ලේ නහර සම් මසද ජරාවක් නම් කයම*
*ගෑණුන්ගේ කිලි කිළුටු පවක් වන්නේ කෝම*

*කෝටියක් සංවරේ සිල් රකිනු බැරුවාට*
*බවුන් වැඩුවා සිල් පදත් රැක්කා පහම*
*සමා අවසර අපෙ හාමුදුරුවනේ අපට*
*සිව්වණක් පිරිසෙනුත් එකක් අඩුවා නොවෙද*

*විශාකාවට වගේ මිණිමෙවුල් නැතුවාට*
*උගස් තිබ්බා කනේ අරුංගල් දෙක නිතර*
*පේරු දනේ දුන්නේ තුන් සිතම පහදන*
*වන්දනාවේ ගියේ හිතේ බර ඔසවාන*

*උරුක්කර දබරෙටම දබරැගිලි අපෙ අතට*
*බුදු පුතේ තරවටුද ගර්ජනා මේ කුමට*
*දරු දෙන්නා රකින්නට මගක් නැති අපෙ උන්ට*
*වදන්නට අණ පනත් හදන්නේ ඇයි මෙහෙම*

*ධාතු වැන්ද රැයක් පෝලිමේ සිටියා අපි*
*පිච්චමල් නෙළුම් මල් එක පොදියේ පිදුවේ අපි*
*උපාසක බළලුන්ට පවා දන් දුන්නේ අපි*
*‘උ’ -වැසියෝ අද මතුත් ‘උ’-වැසියෝ වෙමුද අපි*
*(හෙට්ටිආරච්චි, 2015: 47-48)*

බෞද්ධ භික්ෂුවකගෙන් ධර්මය ශ්‍රවණය කරන නූතන යුගයේ උපාසිකාව විසින් භික්ෂුවගේ බණ අහවර වූ පසුව පෙරළා නැවත උපාසිකාව විසින් භික්ෂුවට බණක් කියනු ලබයි. බෞද්ධ ශාසන ඉතිහාසයේ බණ ඇසූ උපාසිකාවන් මිස බණ කියූ බෞද්ධ උපාසිකාවන් පිළිබඳව වර්තමානය දක්වාම අප අසා නැත. එහෙත්

නූතන යුගයේ මෙම උපාසිකාව පෙරළා බණවරක් බෞද්ධ භික්ෂූන් වහන්සේට පවසයි. එය හුදෙක් බණවරක් පමණක් නොව බෞද්ධාගම මූලික කරගත් බෞද්ධ සංස්කෘතිය විසින් පීඩාවට පත්කරන ලද යුග යුග බද්ධ වූ බෞද්ධ උපාසිකාවන්ගේ හෘද විලාපයයි.

බෞද්ධ ශාසනයේ සහ බෞද්ධ සංස්කෘතියේ අත්තිවාරම වන්නේ භික්ෂු, භික්ෂුණී, උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසයි. පද්‍ය නිර්මාණයේ අපට හමුවන උපාසිකාව පවසන ආකාරයට සිව්වනක් පිරිස මධ්‍යයේ උපාසිකාවන්ද පෙරමුණෙන්ම සිටියි. බුද්ධ දේශනාවේ සඳහන් වන ආකාරයට භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසම එක හා සමාන වෙති. විශාඛා, සාමා, නකුලමාතා, ආදී බුද්ධ කාලීන උපාසිකාවන් මෙන්ම නූතන යුගයේ උපාසිකාවන්ද තම ජීවිතයේ වටිනා සම්පත් බුද්ධ ශාසනයට කැපකරමින් බුදුදහමේ චිරපැවැත්ම වෙනුවෙන් උරදී ක්‍රියාකරයි. බුද්ධ කාලයේ විසූ විශාඛා මහෝපාසිකාව තම රනින් කළ මේළ පලඳනාව විකුණා පූර්වාරාමය සඳ බුදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයට පූජා කළේ බුදුදහමේ චිරපැවැත්ම වෙනුවෙනි. විශාඛාවට මෙන් රනින් කළ මේළ පළඳනා නූතන යුගයේ උපාසිකාවන්ට නොමැති වූවත් දසමසක් කුසෙහි හොවා විළිරුදු විඳ මෙලොවට බිහිකළ තම දරුවා බුද්ධ ශාසනයට පූජා කිරීමට තරම් නූතන බෞද්ධ උපාසිකාවන් නිර්ලෝභීය. ඔවුන්ට උවමනා වන්නේ බුද්ධ ශාසනය රැකගැනීමටය. බුදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයට දන මාන පිළිගන්වමින්, නෙළුම් මල්, පිච්ච මල්, පෙරහැර මංගල්‍යය පවත්වමින් වෙහෙර විහාර ගොඩනගන්නට ක්‍රියා කරමින් නූතන උපාසිකාව බුදුදහමේ මතු දියුණුව වෙනුවෙන් මහා සෙබල මුලක් සේ පෙළ ගැසී සිටියි. කවියේ අභ්‍යන්තර කණිකාවලින් ප්‍රසාරණය වන අර්ථය වන්නේ බෞද්ධ ශාසනය අඛණ්ඩව පැවතගෙන ආවේ බෞද්ධ උපාසිකාවන්ගේ නොමඳ අනුග්‍රහයෙන් බවයි. එහෙත් නූතන උපාසිකාව ප්‍රකාශ කරන පරිදි බෞද්ධ සංස්කෘතිය විසින් බෞද්ධ උපාසිකාව පරිපීඩනයට ලක්කර තිබේ. මෙම පරිපීඩනය ශාරීරික, මානසික පරිපීඩනයක් නොව දෘෂ්ටිවාදමය පරිපීඩනයකි. සංඝමිත්තා තෙරණිය විසින් රැගෙන ආ ශ්‍රී මහා බෝධිය ආසන්නයට යන්නටද, හේමාමාලා නැමැති ස්ත්‍රිය රැගෙන ආ බුදුන් වහන්සේගේ දන්ත ධාතුව වන්දනා කිරීමට යන්නටද නූතන බෞද්ධ උපාසිකාවට තහංචි එල්ලවී තිබේ. ස්ත්‍රියට ජීව විද්‍යාත්මකව, ස්වාභාවිකව උරුම වූ ස්ත්‍රී මාසික ඔසප්වීමට සංස්කෘතිය විසින් කිල්ල යන සංස්කෘතික තහංචිය නිර්මාණය කර තිබේ. ඔසප් කාල සීමාවේදී ස්ත්‍රිය කිල්ල විසින් අපවිත්‍ර කර ඇති බවට වන විශ්වාසයක් සංස්කෘතිය විසින් දෘෂ්ටිවාද මගින් සමාජ මනස්වලට ඇතුළත් කර තිබේ. මෙම අපවිත්‍ර කාල සීමාවේදී කාන්තාව අපවිත්‍ර සත්ත්ව කොට්ඨාසයක් වන බැවින් ඔවුන්ට ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමව සිටින උඩමළුව, දළඳා වහන්සේ වැඩම කරන දළඳා මාළිගාවට යන්නට තහංචි දමා තිබේ. ඔසප් කාල සීමාවේදී ස්ත්‍රියට ආගමික ස්ථානයක ඇතුළත්වීම එම ආගමික ස්ථානය අපවිත්‍ර කිරීමට හේතුවන බවට මතයක් සංස්කෘතිය විසින් නිර්මාණය කරනු ලැබ තිබේ. එහෙත් ශ්‍රී මහා බෝධිය හා දළඳාව ලංකාවට රැගෙන ආවේද ස්ත්‍රීන් දෙදෙනෙකි. බුද්ධ දේශනාවේ සඳහන් වන්නේ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සමස්ත ශරීරයම ජරාවක් බවයි. බෞද්ධ උපාසිකාව ප්‍රශ්න කරන්නේ,

*"ලේ නහර සම් මස්ද ජරාවක් නම් කයම ගැහැණුන්ගේ කිලි කිළුටු පවක් වන්නේ කෝම"*

යන්නයි. ස්ත්‍රියට ස්වාභාවිකවම උරුම වී ඇති මාසික ශුද්ධවීම නහර මස් ලේ වලින් සැදුණු ශරීරයේම කොටසකි. එසේනම් ශුද්ධවීමෙන් පිටවන ලේ පවක් වන්නට හේතුවක් නැත. - එහෙත් මාසික ඔසප්වීමෙන් පිටවන ලේ හේතුවෙන් බෞද්ධ උපාසිකාවන් බෞද්ධ සංස්කෘතිය විසින් ආන්තීකරණයට ලක්වී තිබේ. ස්වාභාවික ස්ත්‍රී ශරීරය හේතුවෙන් කාන්තාව අපවිත්‍ර කොට්ඨාසයක් ලෙස සලකන්නේ බෞද්ධ සංස්කෘතිය පමණක්ම නොවේ. හින්දු ආගම, ක්‍රිස්තියානි ආගම, ඉස්ලාම් ආගම, ස්ත්‍රීන්වීම හේතුවෙන්ම ස්ත්‍රීන් පරිපීඩනයට ලක්කර තිබේ.

> *හින්දු සමය වැන්දඹුවන් පුළුස්සනු ලැබීය. චීන ආගම් ඇයගේ පාද බන්ධනය සඳහා බලකරන ලදි. අප්‍රිකානු ගෝත්‍ර ආගම් හා ඉස්ලාම් ආගම මගින් ජනනේද්‍රිය ඡේදනයට උනන්දු කරන ලදි. ක්‍රිස්තියානි යුරෝපය දහස් ගණනින් මන්ත්‍රකාරියන් පුළුස්සා දමන ලදි (ද සිල්වා, 2004: 80).*

තවද කුරාණයේ සඳහන් වන්නේ "ගැහැණු ළමයෙකු පැවැත්මට නොඡම වඩාත්ම හොඳ වේය. ඉපදුනෝ නම් එක්කෝ විවාහ විය යුතුය. නැත්නම් වැළලිය යුතුය" (ද සිල්වා,

2004: 80) යනුවෙනි. මෙලෙස ලොව පවතින ආගම් විසින් ස්ත්‍රිය පරපීඩනයට ලක්කිරීමට හේතුවී තිබෙන්නේ ස්ත්‍රී පුරුෂ ජීව විද්‍යාත්මක වෙනස හේතුවෙන් ස්ත්‍රිය අපවිත්‍ර යන පුරුෂ මූලික වූ සංස්කෘතික දෘෂ්ටිවාදයයි. ඉහත කවියේ බෞද්ධ උපාසිකාව ප්‍රකාශ කරන පරිදි බෞද්ධ සංස්කෘතිය විසින් බෞද්ධ උපාසිකාවන් සිව්වනක් පිරිසෙන් ඉවත් කොට වෙනම කොට්ඨාශයක් ලෙස සලකා ක්‍රියා කර තිබේ.

*'උ'-වැසියෝ අද මතුත් 'උ'-වැසියෝ වෙමුද අපි"*

යන 'උ'-වැසියෝ යන යෙදුම බෞද්ධ සංස්කෘතිය විසින් බෞද්ධ උපාසිකාව සිව්වනක් පිරිසෙන් ඉවත්කොට සිදුකර ඇති සංස්කෘතික ආන්තීකරණය විශද කරයි. 'උ'-වැසියෝ වෙමුද අපි යන ප්‍රශ්නකරණය තමන් 'උ'-වැසියන් කරවීම වෙනුවෙන් සවිඥ්ඥණික වී ඒ වෙනුවෙන් නැගී සිටිය යුතුය බවට වන ප්‍රකාශනයක් බඳුය. එහෙත් බෞද්ධ උපාසිකාවන්ට එලෙස නැගී සිටිය හැකිද යන්න ගැටලුවකි. මන්දයත් "පරිපීඩිත කණ්ඩායම් සැමවිටම පාහේ පාලක කණ්ඩායම්වල ක්‍රියාවන්ට යටත්ව පිහිටි අතර, ඔවුන් කැරලි ගසමින් නැගී සිටියදී පවා තත්ත්වය එයම විය" (Guha, 1982). කාන්තාවන්ද පරිපීඩිත කණ්ඩායමකි. පුරුෂ මූලික සංස්කෘතිය විසින් ස්ත්‍රිය පරිපීඩනයට ලක්කර ඇති අතර, එම පරපීඩනයට විරුද්ධව නැගි සිටියද ස්ත්‍රී සංස්කෘතික පරිපීඩනයෙහි වෙනසක් සිදු නොවිය හැකිය.

## 4. නිගමනය සහ නිර්දෙශ

අනුරාධා නිල්මිණි, සුහර්ෂණි ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි යන කිවිඳියන් නූතන සිංහල කවිය නියෝජනය කරන, යුගකාරක කිවිඳියක වීමට තරම් කාව්‍යමය බුහුටිතාවන් ප්‍රදර්ශනය කරන නූතන සිංහල කිවිඳියෝ වෙති. මෙම කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණවලින් විශද වන්නේ ස්ත්‍රීන්ගේ පරිපීඩනය පිළිබඳව ප්‍රකාශනයකි. එහිදී විශේෂයෙන්ම ස්ත්‍රිය සංස්කෘතිය සමග අවියෝජනීයව බද්ධ කොට සංස්කෘතියෙහි ගොදුරක් බවට පත්ව පරිපීඩනයට ලක්වන ආකාරය නූතන සිංහල කිවිඳියන් කාව්‍යමය බුහුටිතාවයෙන් සහ රැඩිකල්වාදීව ඉදිරිපත් කරති. ස්ත්‍රිය සහ පුරුෂයා අතර පවතින ලිංගභේදය සංස්කෘතිකමය අර්ථයකින් විග්‍රහ කර තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය ස්ත්‍රිය පවුල් සත්ත්වයකු ලෙස නිර්මාණය කිරීම ස්ත්‍රිය පරිපීඩනයට ලක්වීමට බලපාන බලපෑම් සහගත සාධකයක් වී ඇති බව, උපයෝගි කර ගත් කාව්‍ය නිර්මාණ අනුව පැහැදිලි වේ. තවද ස්ත්‍රී පුරුෂ සමාජභාවය විසින් පුරුෂයා සමාජ සත්ත්වයෙකු ලෙස නිර්මාණය කර තිබෙන අතර, එමගින් පුරුෂයා වටා අසීමිත බලයක් ගොඩනැගී පුරුෂයා සමාජ ක්‍රමයෙහි නායකයා ලෙස බලවත් වී තිබෙන අතර, එම බලවත්වීම ස්ත්‍රීය අප්‍රධානත්වයට, ද්විතීයත්වයට පත්කිරීමටද හේතුවී තිබේ. මෙලෙස ස්ත්‍රිය අප්‍රධානත්වයට හා ද්විතීයත්වයට පත්වීම ස්ත්‍රිකාරකත්වය ක්ෂය කිරීමට හේතුවී ඇති බවටද කරුණු අනාවරණය කරන නූතන සිංහල කිවිඳියන් ස්ත්‍රීය, පුරුෂ මූලික සංස්කෘතියෙන් ද්විතියත්වයට සහ අප්‍රධානත්වයට පත්වීම ස්ත්‍රීයගේ කාරකත්වය ක්ෂය කර ස්ත්‍රීය මරා දැමීමට තරම් ප්‍රබල වී ඇති බවටද අවධාරණය කරයි. සංස්කෘතිය මූලික කරගෙන නිර්මාණය කර තිබෙන පුරුෂයා කේන්ද්‍රකරගත් සංස්කෘතිය පමණක් නොව සංස්කෘතියෙහි අංග (විශේෂයෙන්ම ආගම) මගින්ද ස්ත්‍රී පරිපීඩනය සිදුවන බව ප්‍රකාශ කරන අනුරාධා නිල්මිණි, සුහර්ෂණි ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි යන නූතන සිංහල කිවිඳියන් ස්ත්‍රිය මත ඇතිකරන සංස්කෘතික පරිපීඩනය කායික සහ මානසික පරිපීඩනයට එහා ගිය දෘෂ්ටිවාදීමය පරිපීඩනයක් බවටද තොරතුරු අනාවරණය කරයි. එහිදී විශේෂයෙන්ම පුරුෂයා සමාජ සංවිධානයෙහි ප්‍රධානියාය, ස්ත්‍රිය ද්විතීය සහ අප්‍රධාන තැනැත්තියක්ය, ස්වභාවයෙන්ම ස්ත්‍රිය පවුල් සත්ත්වයෙක්ය, ස්ත්‍රියගේ මාසික ඔසප්චක්‍රය අපවිත්‍ර කිළිටිවලින් යුක්තය බවට වන සංස්කෘතික ප්‍රවාදය සංස්කෘතිය විසින් සමාජ මනස්වලට ඇතුළත් කර ස්ත්‍රිය පරිපීඩනය ස්වාභාවිකරණය කර තිබේ.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


අමරකීර්ති, එල්. (2018). නව කවි සළකුණ. සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

කුමාර, එච්. (2009). ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම්, පුංචි බොරැල්ලඃ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

තිරුචන්ද්‍රන්, එස්. (1995). ස්ත්‍රීවාදි දර්ශන කෝණයෙන් සමාජ න්‍යායන් විග්‍රහ

කිරීමක්. කාන්තා අධ්‍යයන හා පර්යේෂණ කේන්ද්‍රය, කොළඹ.

පඤ්ඤාලෝක, එච්. යූ. (1952). පුරාණ සිව්පද සංග්‍රහය. ලංකා ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ධර්මරත්න, එස්. (2015). සුදුවත ඇඳි කෙකිනිය. ෆාස්ට් පබ්ලිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොළඹ.

ලියනගේ, කේ. සහ වලාකුළගේ, එස්. (2006). ස්ත්‍රි පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී වාදය. ෆෙඩ්රික් ඊබට් පදනම, කොළඹ.

හෙට්ටිආරච්චි, වි. (2015). ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

නිල්මිණී, ඒ. (2014). වත්සියපත්. ෆාස්ට් පබ්ලිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොළඹ.

ද සිල්වා, ඥනසිරි. (2004). දර්ශනය හා කාන්තාව. සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

Bagawat, V. (2004). Feminist Social Thought: An Introduction to six key thinkers, Rawath Publications, New Delhi.

CIDA (1993). Gender Training Manual, Gender and Development Unit, CIDA, Colombo.

Guha, R. (1982). Subaltern Studies, Writing on South Asian Society, London: Oxford Univer city Press.

Sudha, D. K. (2000). Gender Roles. A.P.H. Publishing Company, New Delhi.

Tylor, E. (1920). Primitive Culture. John Murry, London.